**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 අප්‍රේල් 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 20 දින ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනයකළ මතය

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**---------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රධාන ලෙජරයේ එක් ගිණුමක් වශයෙන් ජංගම ගිණුම් 03 ක තොරතුරු පවත්වා තිබූ අතර, ශේෂ පිරික්සුම සැකසීමේ දී වත්කම්, වගකීම් හා හිමිකම් ගිණුම් ශේෂයන් පමණක් උපයෝගී කරගෙන තිබුණි.

(ආ) වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු එකතුව රු.7,425 ක් උපයෝගීතා සේවා සඳහා ගාස්තු, ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) වර්ෂය තුළ දී මිලදී ගෙන තිබූ රු.37,680 ක් වටිනා පුස්තකාල පොත් 112 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබූ රු.15,500 ක් වටිනා පරිගණක යන්ත්‍රයක් සහ වටිනාකම ආගණනය නොකල පරිගණක උපාංග 14 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(උ) අවසන් තොගයේ වටිනාකම පිළිවෙලින් රු.458 ක් වැඩියෙන් හා රු.28,973 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඌ) ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ කාලපරිච්ඡේදය සඳහා වන වත්කම් අත්පත් කර ගැනීම රු.29,808,658 ක් ලෙස දක්වා ඇතත්, ශේෂපත්‍රයේ කාල පරිච්ඡේදය සඳහා එකතු කල වත්කම් වටිනාකම රු.31,048,613 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,239,955 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) සමාලෝචිත වර්ෂයේ දී වත්කම් ඉවත් කිරීම සමුච්චිත අරමුදල් ගිණුමට ගිණුම් ගත කර පෙර වර්ෂ ගැලපීම් යටතේ ගලපා තිබුණි.

(ඒ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ණයහිමියන් රු.471,979 කින් අඩුවීම සහ රු.194,897 ක වත්කම් ඉවත් කිරීම එකතු කිරීම් ලෙස ගලපා තිබුණි.

(ඔ) සභාවට ලැබී තිබූ කෘ කැබ් රථය, මෝටර් ග්‍රේඩරය හා බැකෝ ලෝඩරයෙහි වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඕ) රු.1,550,000 ක් වූ අංක NW –RD 1652 දරන ට්‍රැක්ටරය සහ අංක NW –RW 8875 දරන ට්‍රේලරයේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට පියවර ගෙන නොතිබූ අතර, ඒ වෙනුවට ඒවා පවරා ගැනීමට වැයකර ඇති රු.35,000 වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ක) අතැති තොගයට අයත් එකතුව රු.5,570 ක් ගිණුම්වලට ඇතුළත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ග) රු.4,750 ක් වූ ගිනි නිවන උපකරණය හා රු.6,000 ක පරිගණක ප්‍රින්ටරය ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**-------------------------**

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල ශේෂය රු.5,858,783 ක් වූ අතර, උපලේඛන අනුව එම ශේෂය රු.5,893,947 ක් වූයෙන් රු.35,164 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.4,997,185 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.5,746,743 ක් විය එයින් වර්ෂයකට වැඩි ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.3,427,777 ක් වූ අතර, වර්ෂ 03 කට වැඩි ගෙවිය යුතු ශේෂවල වටිනාකම රු.243,629 ක් විය.

(ආ) වර්ෂ ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එමින් තිබූ රු.243,629 ක් වූ රාජ්‍ය භාගය පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණ අතර, එය රජයේ ආදායමට බැර කිරීමටද පියවර ගෙන නොතිබුණි.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.2,881,442 ක ශේෂය තුළ 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 07 කට අදාල රු.709,186 ක් ද ඇතුළත්ව තිබීමෙන් එම ප්‍රමාණය වැඩිපුර ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) වර්ෂයකට වැඩි කාලයක සිට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස එම උපලේඛන පිළියෙල කර ගණනය කිරීමෙන් තොරව 2013 වර්ෂය සඳහා වන රු.30,000 ක් හා 2014 සඳහා රු.80,000 ක ඇස්තමේන්තුගත අගයක් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද 2014 වර්ෂයේ කර්මාන්ත 05 ක් සඳහා රු.436,000 ක් ද, 2015 වර්ෂයේ එක් කර්මාන්තයක් සඳහා රු.40,000 ක් ද, වශයෙන් එකතුව රු.476,000 කින් ගෙවන ලද සියයට 20 අත්තිකාරම් ප්‍රතිපාදන ලැබී නැති නිසා පියවා ගැනීමට නොහැකිව තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම්වල එකතුව රු.1,915,412 ක් ව තිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,728,860 ක් වූ ගිණුම් ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය හා පරිපාලන) 217 රීතිය ප්‍රකාරව සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,393,978 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,215,036 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

**වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම අදාල විචලනයන් ද සමඟ පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>පුනරාවර්තන වියදම</u> | | | |
| පුද්ගල පඩිනඩි | 22,978 | 23,267 | (289) |
| අනෙකුත් | 6,236 | 6,758 | (522) |
| උප එකතුව | 29,214 | 30,025 | (811) |
| **ප්‍රාග්ධන වියදම** | 2,088 | 7,554 | (5,466) |
| මුළු එකතුව | 31,302 | 37,579 | (6,277) |

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම හා තථ්‍ය ප්‍රාග්ධන වියදම අතර, විචලනය සියයට 72 ක් විය.

**2.3** **කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

2014 වර්ෂයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර, අනුපාතය 1.08:0.93 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ එය 1.6:0.6 ක් විය. එය සම්මත අනුපාතය 2:1 ක් විය යුතුව තිබුණි.

**2.4** **ආදායම් පරිපාලනය**

**2.4.1** **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| **වරිපනම්** බදු හා කුලී | 1,733 | 2,515 | (782) |
| බලපත්‍ර ගාස්තු | 141 | 154 | (13) |
| දඩ හා වරෙන්තු | 2,740 | 851 | 1,889 |
| වෙනත් | 26,688 | 2,595 | 24,093 |
| | 31,302 | 6,115 | 25,187 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂයේ ආදායම් අයකර ගැනීම්, ඇස්තමේන්තුගත ආදායමින් සියයට 30 ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ දී සියයට 19 ක අගයක් ගෙන තිබීමෙන් සියයට 11 ක පසුබෑමකට ලක්ව තිබුණි.

(ii) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සැසඳීමේ දී දෙසැම්බර් 31 දිනට ඇස්මේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර, විචලනය සියයට 69 ක් හා සියයට 80 ක් ව තිබුණි. ඒ අනුව, අධි ඇස්තමේන්තු කිරීමක් සිදුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් හිඟ ආදායම් හා බිල්කල ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| ආදායම් ශීර්ෂය | 2015.01.01 දිනට හිඟ ආදායම | හිඟයෙන් අයවීම | වර්ෂය තුළ බිල්කල ආදායම | බිල්කල ආදායමින් අයවීම | 2015.12.31 ට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| බදුකුලී | 03 | 03 | 998 | 1,137 | (139) |
| බලපත්‍ර ගාස්තු | -- | -- | 80 | 101 | (21) |
| වරෙන්තු ගාස්තු හා දඩ | 388 | 388 | 851 | 507 | 332 |
| වෙනත් ආදායම් | 131 | 21 | 90 | -- | 200 |

ඉහත තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ වරෙන්තු ගාස්තු හා දඩවල 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.344,000 ක් වුවද, සභාව හිඟ ලෙස ගිණුම් ගතකර තිබුණේ රු.332,000 ක් නිසා රු.12,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

**2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) <u>උසාවි දඩ</u>

සමාලෝචිත වර්ෂයේ ජූනි සිට නොවැම්බර් දක්වා එකතුව රු.509,831 ක උසාවි දඩ ගෙන්වා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණ අතර, 2015 ජූනි සිට සැප්තැම්බර් දක්වා කාලයට අදාල රු.281,998 ක් පමණක් ණයගැතියන් ලෙස ගිණුම් ගතකර තිබුණි. ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් වෙනුවෙන් රු.50,000 ක ඇස්තමේන්තුගත මුදලක් පමණක් ඒ වෙනුවට ගිණුම් ගත කිරීමට සභාව පියවර ගෙන තිබුණි.

(ආ) <u>මුද්දර ගාස්තු</u>

ලැබිය යුතු මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල නොකිරීම නිසා 2013 ජූනි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු.200,000 ක ඇස්තමේන්තුගත මුදලක් ගිණුම්ගත කිරීමට සභාව විසින් කටයුතු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාව ප්‍රමාණවත් ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් හෝ නව ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි යොමුවීමක් සිදුකර නොතිබුණි.

## 3.2 හඳුනාගත් අලාභ

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව රු.2,804 ක් වටිනා පොත් 20 ක් අස්ථානගත වී ඇති බව නිරීක්ෂණය වූ අතර, එම අලාභය ඊට වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 03 කට පෙර සිට රු.3,745 ක් වටිනා පොත් 18 ක් බැහැරට දී තිබුණ ද, ඒවා ආපසු ලබා ගැනීමට හෝ එහි අලාභය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

එකතුව රු.1,180,660 ක පිරිවැය ඇස්මේන්තු මත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් පිළිසකර කිරීමට භාරදී තිබූ මාර්ග 03 ක් වර්ෂය අවසානයට ද වැඩ නිමකර භාර දී නොතිබුණි. එහි එක් මාර්ගයක් සඳහා සියයට 20 ක වැඩ ආරම්භක අත්තිකාරම් ලෙස රු.120,000 ක් ගෙවා තිබුණද, එය අයකර ගැනීමට එහි කල වැඩ ප්‍රමාණවත් වී නොතිබුණි. අනෙකුත් මාර්ග දෙකෙහි ප්‍රගතියද පිළිවෙලින් සියයට 45 ක් හා සියයට 40 ක් විය.

# 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.2,088,250 ක් වූ අතර, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.7,554,076 ක් වූයෙන්, එහි විචලනය සියයට 362 කට ආසන්න අගයක් විය.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

සභාව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබුණද, 2015 ජුලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.4 විගණන හා කළමනාකරණ කමිටු

සභාව 2014 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇති අතර, කාර්තුවකට එක් වතාවක් හෝ මෙම කමිටුව පැවැත්විය යුතු වුවත්, 2015 වර්ෂය සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක් තිස්සේ සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවති අතර, එම තනතුරේ වැඩ බැලීම සංවර්ධන නිලධාරී (ආදායම් ප්‍රවර්ධන) විසින් සිදුකරමින් තිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, වැඩ පරිපාලක, නල ළිං කාර්මික හා විදුලි කාර්මික යන තනතුරු දිගින් දිගටම පුරප්පාඩුව පවතින නිසා ප්‍රාදේශීය සභාවෙන් ප්‍රදේශයට සිදුවන මහජන සේවාව හා අධීක්ෂණ කටයුතු විධිමත් ලෙස ඉටුකිරීම සිදු නොවන බව නිරීක්ෂණය විය.

**4.6 වත්කම් කළමනාකරණය**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

සභාව සතු රු.332,500 ක් වටිනා මිනි කුබෝටා ට්‍රැක්ටරය හා එම ට්‍රේලරය වර්ෂ 11 කට අධික කාලයක් තුළ නිෂ්ක්‍රීයව තිබුණි.

(ආ) <u>පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>

රු.16,380,000 ක් වටිනා අංක WP – 2A-5050 දරන බැකෝ ලෝඩරය සහ රු.18,000,000 ක් වටිනා අංක 2A-5289 මෝටර් ග්‍රේඩරය 2016 මැයි 17 දින වන විටත්, සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය